City NEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නිල ඊ පුවත් පත
කලාපය 03
2023 ජනවාරි 01

# “නව වසරේදී නවීන තාක්ෂණය භාවිතා කරමින් නාගරික සංවර්ධන හා නිවාස ක්ෂේත්‍රය දියුණු කරනවා”

## අමාත්‍ය ප්‍රසන්න රණතුංග පාර්ලිමේන්තුවේ දී කියයි.

පිටුව 03







වර්තමානයේදී එල්ලවී ඇති ගෝලීය අර්බුද හමුවේ ශ්‍රී ලාංකික අපටද විවිධාකාර අභියෝගයන්ට මුහුණ දීමට සිදුව ඇත. එල්ලවන අභියෝග හමුවේ රටක් ජනතාවක් අත්විඳි දුෂ්කරතාවයන් බොහෝය. එසේත් මෙම දුෂ්කර අභියෝගයන් ජයගැනීමට නම් අප නිවැරදි අවබෝධයෙන් යුතුව කටයුතු කළ යුතුය. ඕනෑම ආකාරයේ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්නට උදාවන නව වසර තුළම බලාපොරොත්තුවකින් යුතුව පිළිගැනීම සියලු අපගේ සිරිතවේ. එබැවින් උදාවන්නාවූ 2023 නව වසර අපගේ ජීවිත සතුටින් පුරවන විශ්වාසය පෙරදැරිව නැවුම් බලාපොරොත්තු හා අපේක්ෂාවන්ගෙන් යුතුව පිළිගනිමු. එකිනෙකා අතර බැඳීම් ශක්තිමත් කර ගනිමින් ශ්‍රී ලාංකිකයන් ලෙස ලොව ඉදිරියේ නව ජවයකින් නැගී සිට සෞභාග්‍යමත් දේශයක් උදෙසා මානව දයාවෙන් යුතුව සමගිව කිරීමට උදාවන නව වසරේදී සැමට ශක්තිය ලැබේවා.

නව වසර උදාවට ආයුබෝවන්,
ප්‍රීතියෙන් හා බලාපොරොත්තුවෙන්
පිරි නව වසර සාදරයෙන් පිළිගනිමු...!



ප්‍රසන්න රණතුංග.
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

2023 නව වසර එළඹෙන්නේ දේශයටත් ජනතාවටත් නව අරමුණු, අධිෂ්ඨානයන් පෙළ ගැසෙන නව යුගයක උදාව සනිටුහන් කරමින් නව වසරේ අපේක්ෂාවන් යථාර්ථවත් කර ගත හැක්කේ ගෙවී ගිය වසරේ අප උගත් පාඩම් යළි විමසා බැලීමෙනි. නව වසරේදී ජාති ආගම් කුලභේදයෙන් තොරව රටේ ජනතාවට සාමයෙන් ජීවත්වීමට හැකි පරිසරයක් ගොඩනැගීම රජයේ පරම අභිලාෂයයි. එබැවින් පසුගිය වසරේ සිදුවූ අඩුපාඩු සකස්කර ගනිමින් ඉදිරියට යාමට නව වසර තුළ අපි අධිෂ්ඨාන කර ගනිමු.

නව වසර ලක්වාසී හා ලෝකවාසී සැමට සාමය ,සමෘද්ධිය උදාකරන සුබ නව වසරක්ම වේවා!



අරුන්දික ප්‍රනාන්දු
නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍ය

කොවිඩ් -19 වසංගත ව්‍යාප්තිය හා අනෙකුත් ගෝලීය අර්බුදවලින් අප රට හෙම්බත්ව තිබේ. එබැවින් ශක්තිමත් දේශීය ආර්ථිකයක් ගොඩනගා ගැනීමට උදාවන නව වසරේදී දැඩිව අදිටන් කරගනිමු. අනාගත දරු පරපුරේ බලාපොරොත්තු මල්ඵල ගන්වනු වස් විනයගරුක සමාජයක් තුළින් ශක්තිමත් සුරක්ෂිත රටක් බිහිකර ගැනීමට උදාවන නව වසරේදී අප එකාවන්ව දැඩිව අත්වැල් බැඳගත යුතු බව මා විශ්වාස කරමි.

රටේ සමස්ත ජනතාවටත්, අප දරු පරපුරටත් ඉසුරුබර අනාගතයක් උරුමවන සුබ නව වසරක් වේවා යි මම ඉතසිතින් ප්‍රාර්ථනා කරමි!



ජේනුක විදානගමගේ
නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍ය




මාධ්‍ය ඒකකය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2 වන මහළ
සෙත්සිරිපාය
බත්තරමුල්ල
94 11 286 7163
94 11 286 5479
paper.citynews@gmail.com

පිටු සැකසුම - ධනුෂිකා කුමාරි
සම්බන්ධීකරණය - දිලිනි කෞශල්‍යා , P.B.S. සම්පත්, කසුන් තාරක, නිලංක නිරෝෂන්, මුනීරා අබුබකර්, නිළිණ නිර්මාල්



# අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පාසල් උපකරණ

(අමිල දර්ශන හේරත්)

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අනුග්‍රහයෙන් මිනුවන්ගොඩ ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ බෙදා දීම පසුගියදා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණි.

එක් ළමයෙකු සඳහා රුපියල් 2,500 ක් වටිනා පාසල් බෑගයක්, රුපියල් 2,000 ක් වටිනා පාවහන් ලබා ගැනීමට වවුචරයක්, රුපියල් 2,500 ක් වටිනා පාසල් උපකරණ මෙහිදී ලබා දුන්නේය.







(ඡායාරූප - කලින් හේවාපතිරණ)



# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ වැය ශීර්ෂය




## අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පාර්ලිමේන්තුවේදී සිදුකළ කතාව

**(කාලක සංජීව දහනායක)**

කොවිඩ් වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදය ඇතිවීමට පෙර තිබූ තත්ත්වයට වඩා ඉහළ තත්ත්වයකට නාගරික සංවර්ධන හා නිවාස ක්ෂේත්‍රය ගෙනඒම තම බලාපොරොත්තුව බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පාර්ලිමේන්තුවේදී පැවසීය.
පවතින ආර්ථික අර්බුදය හමුවේ ඒ සඳහා විවිධ බාධා එල්ලවුවද නවීන තාක්ෂණය භාවිත කරමින් නාගරික සංවර්ධන හා නිවාස ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමට සූදානම් බවද අමාත්‍යවරයා සඳහන් කළේය.

අපිත් දේශපාලන සංස්කෘතියක් තුළ අපිත් රටක් ගොඩනගන්න නම් අපිත් අදහස්වලින් පෝෂණය විය යුතු බවද හෙතෙම කීය.

අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා මේ බව සඳහන් කළේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ කතාව ආරම්භ කරමිනි. එහිදී අමාත්‍යවරයා මෙසේද පැවසීය.

> " පසුගිය මාස දෙක තුළ ඩොලර්වලට නිවාස 06 ක් විකුණා එමගින් උපයා ඇති මුදල ඇමෙරිකානු ඩොලර් 276,650ක "

අද අපි සාකච්ඡාවට ගන්නේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ වැය ශීර්ෂ වන 123, 291, 309 සිට 311 දක්වා වන වැය ශීර්ෂ පිළිබඳවයි.

පවතින තත්ත්වය තුළත් මෙවර අයවැයෙන් රුපියල් මිලියන 48,491ක මුදලක් මේ අමාත්‍යාංශය සඳහා වෙන් වී තිබෙනවා. එහි පුනරාවර්තන වියදම් ලෙස වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 2,744ක්. අපි සමස්ත මුදලෙන් රුපියල් මිලියන 43,740 ක් සංවර්ධන කටයුතු සඳහා වෙන් කර තිබෙනවා. නාගරික සංවර්ධන වැඩසටහන් සඳහා රුපියල් මිලියන 20,433ක්, නිවාස සංවර්ධන වැඩසටහන් සඳහා රුපියල් මිලියන 16,057ක් මෙන්ම කසළ කළමනාකරණය හා පරිසර ආරක්ෂණ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 7,250ක් වෙන් කර තිබෙනවා. මෙම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු 4 සඳහා රුපියල් මිලියන් 2007ක් වෙන් කර තිබෙනවා.

කොවිඩ් වසංගතයත් එක්ක රට මුහුණ දුන් ආර්ථික අර්බුදය නිසා රටේ බොහෝ සංවර්ධන ව්‍යාපෘති අඩාල වුණා. ආනයනය පාලනය කරන්න සිද්ධ වෙච්ච නිසා වෙළඳපොළේ ඇති වූ හාණිය නිසාත්, අමුද්‍රව්‍ය මිල ඉහළ යාමත් මේ තත්ත්වයට හේතු වූ බව අපි පිළිගන්න ඕනේ. මම මේ අමාත්‍යාංශය භාරගත්තේ එවැනි පසුබිමක් තුළ.

සමහර ආයතනවල සේවකයන්ගෙ පඩි ගෙවාගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ ආයතනවල සේවකයන්ගේ රැකියා සුරක්ෂිත කරගෙන ආයතන ලාභ ලබන තත්ත්වයට පත්කර ගන්න අපි උපදෙස් දී තිබෙනවා.

කැබිනට් ඇමතිවරයා විදිහට මගෙත්, රාජ්‍ය අමාත්‍යවරුන්ගෙත් අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු සියලු ආයතන ප්‍රධානීන්ගේත්, අපේ අමාත්‍යාංශය යටතේ ඉන්න ඉහළ සිට පහළ දක්වා සියලුම දෙනාගෙන් අපේක්ෂාව වෙලා තියෙන්නේ පවතින තත්ත්වය තුළ මේ නාගරික සංවර්ධන හා නිවාස ක්ෂේත්‍රය ගොඩගන්න එක. ඒ වගේම ක්ෂේත්‍රයේ නිරත වෙලා ඉන්න කම්කරුවාගේ සිට ඉහළම ආයෝජකයා දක්වා රැක ගැනීම. ඒ සඳහා ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

මම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය භාරගත්තාට පස්සේ මුලින්ම කළේ අපිට මුහුණ දෙන්න සිදුවුණ අභියෝග හඳුනා ගැනීම. ඒ අභියෝග හඳුනා ගෙන ඒවාට විසඳුම් ලබා දෙන්න පුළුවන් විවිධ පාර්ශව එක්ක ප්‍රමාදය, බැංකු පහසුකම් සීමා කිරීම, රුපියල අවප්‍රමාණය වීම, ඉන්ධන මිල, ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟ වීම වගේ කාරණා මේ ක්ෂේත්‍රය කඩා වැටීමට හේතු වුණා.

මේ තත්ත්වය හඳුනාගත් අපි අමාත්‍යාංශයක් විදිහට ඉදිකිරීම් ක්ෂේත්‍රය රැකගැනීම සඳහා විශේෂ පියවර කිහිපයක් ගත්තා. අපේ පළමු පියවර වුණේ ඉදිකිරීම් කර්මාන්තයේ පැවැත්ම උදෙසා සහනදායී ක්‍රියාමාර්ගයක් ගැනීමට ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කිරීමයි. එහි ප්‍රතිඵලයක් විධියට ගරු ජනාධිපතිතුමා විසින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. එම කැබිනට් පත්‍රිකාව මම සභාගත කරනවා.

මේ තත්ත්වය හඳුනාගත් අපි අමාත්‍යාංශයක් විදිහට ඉදිකිරීම් ක්ෂේත්‍රය රැකගැනීම සඳහා විශේෂ පියවර කිහිපයක් ගත්තා. අපේ පළමු පියවර වුණේ ඉදිකිරීම් කර්මාන්තයේ පැවැත්ම උදෙසා සහනදායී ක්‍රියාමාර්ගයක් ගැනීමට ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කිරීමයි. එහි ප්‍රතිඵලයක් විධියට ගරු ජනාධිපතිතුමා විසින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. එම කැබිනට් පත්‍රිකාව මම සභාගත කරනවා.

මේ අනුව 2020 මාර්තු සිට 2022 දෙසැම්බර් අවසානය දක්වා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියුතු වුවන්ට සහන සැලසෙනවා. මෙම සහන ලබන වසරේ (2023) දෙසැම්බර් දක්වා දීර්ඝ කිරීමට අපි කටයුතු කර ගෙන යනවා. ඒ සඳහා කැබිනට් මණ්ඩලයට අමාත්‍ය මණ්ඩල සටහනක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා.

නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය යටතේ සිදු කෙරුණු ඉදිකිරීම් සඳහා ගෙවීම් ප්‍රමාද වී තිබෙන මුදල රුපියල් බිලියන 12කට ආසන්නයි. මහා මාර්ග ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ටත් මේ හා සමාන මුදලක් ගෙවන්න තියෙනවා.

අපේ නිවාස අමාත්‍යාංශය යටතේ ගෙවන්න තිබෙන මෙම මුදල මේ වන විට ක්‍රමානුකූලව, කඩින් කඩ ගෙවමින් තියෙනවා. අපි විශ්වාස කරනවා ලබන වසරේ මුල් කාර්තුව අවසන් වන විට මේ ගෙවීම් කටයුතු අවසන් කරන්න අපට පුළුවන් වෙයි කියලා.

අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන සිඩා ආයතනය (ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය) ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් පියවර රැසක් ගෙන තිබෙනවා. උදාහරණයක් විධියට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිරත පහළම කම්කරුවාගේ සිට ඉහළම පුද්ගලයා දක්වා වෘත්තීය පිළිගැනීමක් (Recognition) ඇති කිරීමට කටයුතු කර තිබුණේ නෑ. එවැනි පිළිගැනීමක් ඇති කිරීමට නම් එම වෘත්තිය ප්‍රමිතිගත කිරීම කළ යුතුයි. එම කාර්යය පැවරෙන්නේ මෙම ආයතනයටයි.

> " බාධා එල්ලවුවද නවීන තාක්ෂණය භාවිතා කරමින් නාගරික සංවර්ධන හා නිවාස ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමට සූදානම් "

ඒ අනුව දැනට පවතින ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත බලගන්වා මෙතෙක් කලක් ප්‍රමාද වී තිබූ ඉදිකිරීම් ශිල්පීන් සහ නිපුණ ඉදිකිරීම් ශිල්පීන් වර්ග කිරීම මීට සති දෙකකට පෙර අපි ආරම්භ කළා. ඒ අනුව ඉදිකිරීම් ශිල්පීන්ට වෘත්තීය හැඳුනුම්පතක් නිකුත් කිරීම දැන් සිදු වෙනවා. මේ නිසා ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවයද ඇති වී තිබෙනවා. මේ වැඩපිළිවෙළ ඉදිරි වසර තුළ දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

අද රට මුහුණපා තිබෙන ආර්ථික අර්බුදයේ මූලික ප්‍රශ්නය තමයි ඩොලර් නැතිකම. අපේ අමාත්‍යාංශය ඩොලර් උපයන අමාත්‍යාංශයක් නොවෙයි. නමුත් පවතින තත්ත්වය තුළ අමාත්‍යාංශයක් විදිහට අපිට කරන්න පුළුවන් මොනවද කියලා අපි අලුතින් හිතුවා.

නාගරික සංවර්ධන අධිකාරිය මඟින් පාර්ශ්වික නිවාස ව්‍යාපෘති 12ක් මේ වන විට ක්‍රියාත්මක කර තියෙනවා. ඒ යටතේ දැනට නිවාස ඒකක 3,667ක් ඉදිවෙමින් පවතිනවා. ඒ අනුව අපි විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට සහ විදේශවල සේවය කරන අපේ අයට ඩොලර්වලට නිවාස අලෙවි කරන ව්‍යාපෘතියක් හඳුන්වා දුන්නා. අපි ද්විත්ව පුරවැසිභාවය හා ස්ථිර වීසා මත විදේශගතව ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ටත් මේ නිවාස මිල දී ගැනීමේ අවස්ථාව ලබාදෙන්න කටයුතු කළා. ඩොලර්වලින් මේ නිවාස මිල දී ගන්නවා නම් අපි 10%ක වට්ටමක් දෙන්න කටයුතු කරනවා. මේ වෙනුවෙන් අපි ඩොලර් ගිණුමක් පිහිටුවන්න

අපි පසුගිය මාස දෙක තුළ ඩොලර්වලට නිවාස 06 ක් විකුණා තිබෙනවා. ඒ අනුව ඇමෙරිකානු ඩොලර් 276,650ක මුදලක් මේ වන විට උපයා තිබෙනවා. මේ අලෙවි කෙරුණු සියලුම නිවාස වියත්පුර නිවාස ව්‍යාපෘතියේ ඒවා. ඩුබායි, ඇමෙරිකානු එක්සත් ජනපදය, කැනඩාව, කටාර් වගේ රටවල්වල සේවය කරන සහ වැඩකරන ශ්‍රී ලාංකිකයන් තමයි මේවා මිල දී ගත්තේ. තවත් විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් 10 දෙනෙකු මේ නිවාස මිල දී ගන්න අයදුම් කරලා තියෙනවා. ඒ ක්‍රියාවලිය මේ වන විට ක්‍රියාත්මකයි. මේ මාසය අවසන් වෙන්න කලින් අපි ඒ අලෙවි කටයුත්ත අවසන් කරනවා. එම නිවාස 10 යේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් 352,800 ක්.

ලබන වසරේ අපේ ඉලක්කය "ඩොලර් නිවාස ව්‍යාපෘතිය" මගින් ඇමෙරිකානු ඩොලර් මිලියන 02ක ඉලක්කයක් සපුරා ගැනීම. විදේශීය පුරවැසියන්ට ද මේ නිවාස මිල දී ගැනීමේ අවස්ථාව ලබාදෙන්න අපි තීරණය කළා. ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශය මත විවෘත කරන අභ්‍යන්තර ආයෝජන ගිණුමක් (Inward Investment Account) විවෘත කිරීමට අපි පියවර ගන්නවා.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට තමයි වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව තිබෙන්නේ. දිවයින වටා තිබෙන වෙරළ තීරයේ නව සංචාරක ආකර්ෂණීය ස්ථාන 24ක් අපි අළුතින් හඳුනාගෙන තිබෙනවා. ගංගේ වාඩිය, පුත්තලම් කලපු දූපත්, වයිත්තාල, තීතගල්ල මේ සංචාරක ආකර්ෂණීය ස්ථානවලින් කිහිපයක්. සංචාරක අමාත්‍යාංශය හා එක්ව අපි ඉදිරියේ දී මෙම සංචාරක ස්ථාන පිළිබඳව සංචාරකයන් අතර ප්‍රචාරයක් ලබාදීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරනවා.

අපේ රටට අයත් දූපත් 113 ක් තිබෙනවා. උතුරු නැගෙනහිර ප්‍රදේශවල විතරක් දූපත් 76ක් පිහිටා තිබෙනවා. මේ දූපත්වල විවිධ ජනකොටස් ජීවත් වෙනවා. ඔවුන්ටම ආවේණික උපසංස්කෘතීන් ඒ අයට තියෙනවා. මේ දූපත් සංවර්ධනය කිරීම සඳහා දූපත් සංවර්ධන අධිකාරිය නමින් නව ආයතනයක් පිහිටුවීමට කැබිනට් පත්‍රිකාවක් මම ඉදිරිපත් කළා. ඒ කැබිනට් පත්‍රිකාව පිළිබඳව ගරු ඇමතිතුමන්ලා විවිධ නිරීක්ෂණයන් ඉදිරිපත් කර තිබෙනවා. අපේ අපේක්ෂාව වුණේ මේ දූපත් සංවර්ධනය කරලා සංචාරක ආකර්ෂණය ඉහළ නංවාලීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා රටට ඩොලර් උපයා ගැනීමේ වැඩපිළිවෙළක් හදන්න. කැබිනට් මණ්ඩලයේ නිර්දේශ අනුව අපි ඒ සඳහා ඉදිරියේ දී අවශ්‍ය පියවර ගන්නවා.

නාගරික සංවර්ධන අධිකාරිය මහනගර සභා 24ක්, නගර සභා 41ක්, ප්‍රාදේශීය සභා 208ක්, නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කරලා තියෙනවා. මේ ප්‍රදේශවල සියලුම සංවර්ධන කටයුතු සඳහා අවසර දීමේ බලය තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියට. සාමාන්‍යයෙන් මේ ක්‍රියාවලිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, ජල සම්පාදන මණ්ඩලය වැනි ආයතන 26 ක් සම්බන්ධ වෙනවා. මෙවැනි සංවර්ධන බලපත්‍රයක් අනුමත කරන්න මීට කලින් වසරක පමණ කාලයක් ගියා. මේ නිසා ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට බලාපොරොත්තු වුණු ආයෝජකයන් අධෛර්යමත් වුණා. ඒ වගේම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අනවශ්‍ය ප්‍රමාදයන් ඇතිවුණා.

මේ තත්ත්වය සැලකිල්ලට ගෙන සංවර්ධන බලපත්‍ර කඩිනමින් ලබාදීමේ වැඩසටහනක් අපි ආරම්භ කළා. අපි එය නම් කළේ One Stop Unit ලෙසයි. මෙම ඒකකය අදියර 03ක් යටතේ ක්‍රියාත්මක වෙනවා. පළමු අදියර යටතේ කොළඹ දිස්ත්‍රික්කය තුළත්, දෙවන අදියර යටතේ කොළඹ මහා නගර සභා සීමාව තුළත්, නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම දිස්ත්‍රික් කාර්යාල සහ සියළුම පළාත් පාලන ආයතන ආවරණය වන පරිදිත් ක්‍රියාත්මක කරන්න අපි අපේක්ෂා කරනවා.

> " නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් බැංකුවක් සකස් කිරීමට අපි කටයුතු කරගෙන යනවා. "

**3 වන පිටුවෙන්**

මේ ව්‍යාපෘතියට සමගාමීව නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් බැංකුවක් සකස් කිරීමට අපි කටයුතු කරගෙන යනවා. නාගරික සංවර්ධන අධිකාරියට අයත් දිවයිනේ ප්‍රධාන නගර තුළ දැනට උපරිම භාවිතයට යොදාගෙන නොමැති ඉහළ වෙළඳපොළ වටිනාකමක් තියෙන ඉඩම් සහ ගොඩනැගිලි අක්කර 1,008 ක් පමණ තියෙනවා. ජාතික සැලැස්මකට අනුව රාජ්‍ය හා පුද්ගලික අංශයේ හවුල්කාරිත්වයෙන් එම ඉඩම් සංවර්ධනය කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

නාගරික සංවර්ධන අධිකාරියට තමයි නගර සංවර්ධනය පැවරී තියෙන්නේ. ප්‍රතිපාදන ගැටළු නිසා අපට මේ සම්පූර්ණ නගර සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන්න බැරි වුණා. තාමත් සැලසුම් සකස් කිරීම අපි නතර කළේ නෑ. නාගරික ප්‍රදේශ 272කින් 70කම සැලසුම් මේ වන විට සකස් කර අවසන්. ලබන වසර තුළ නාගරික බලප්‍රදේශ 272ම නගර සැලසුම් සකස් කර ඒවා ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ නගර සංවර්ධන කටයුත්තකම සිදුවන්නේ පළාත් පාලන ආයතන සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ කරගෙනයි.

> " ඉදිකිරීම් ශිල්පීන්ට වෘත්තීය හැඳුනුම්පතක් නිකුත් කිරීම ඉදිරි වසර තුළ දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. "

ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ නාගරික මධ්‍යස්ථාන 117ක් තෝරා ගෙන ඒවායේ මූලික මහජන අවශ්‍යතා සංවර්ධනය කිරීම සඳහා සියක් නගර වැඩසටහන අපි ක්‍රියාත්මක කළා. හඳුනාගත් නගර 117න් නගර 116ක ව්‍යාපෘති ආරම්භ කර තියෙනවා. ඉන් නගර 110 ක වැඩ අවසන්. මේ ව්‍යාපෘතිය පිළිබඳ විවිධ ගැටළු තිබෙන්න පුළුවන්. ඒ ගැටළු තිබෙන ප්‍රදේශ අපි හඳුනා ගෙන ඒවා නිවැරදි කිරීමටත් ඉදිරියේදී කටයුතු කරනවා.

ඒ වගේම පවතින ආර්ථික අර්බුදය නිසා තාවකාලිකව නතර වී ඇති නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන ව්‍යාපෘති ලබන වසර මුල වන විට යළි ආරම්භ කිරීමට හැකි වනු ඇතැයි අපි විශ්වාස කරනවා. රටේ පවතින මූල්‍ය අර්බුදය යථා තත්ත්වයට පත් වන තුරු පොදු පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාණ්ඩාගාර අරමුදල් භාවිතා කිරීමට අපි බලාපොරොත්තුවන්නේ නෑ. ඒ සඳහා ස්වයං මූල්‍ය ක්‍රමවේදය (Self Financing) භාවිතා කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. පෞද්ගලික අංශයද ඒ වෙනුවෙන් දිරිමත් කිරීමට අපි අපේක්ෂා කරනවා.

ඒ සඳහා විවිධ සංකල්ප ඉදිරිපත් කළා. ගම් උදාව, ජන සෙවණ වගේ නම් වලින් ඒවා හැඳින්වුවා. නිවාස විෂය පැවරෙන විවිධ ඇමතිවරු තම තමන්ගේ සංකල්ප ක්‍රියාත්මක කරන්න ණය ආධාර වැඩසටහන් අතීතින් හඳුන්වා දුන්නා.

කොවිඩ් වසංගතයත් ආර්ථික අර්බුදයත් නිසා අපි පසුගිය කාලයේ ආරම්භ කරපු මේවගේ ව්‍යාපෘති ගණනාවක් අතරමග නතර කරන්න සිද්ධ වුණා. ලබන ජනවාරි මාසයේ සිට මේ නතර වුණු නිවාස ව්‍යාපෘති ණය සහ ආධාර වැඩසටහන් අපි යළි ආරම්භ කරනවා.

ඒ වගේම එම ව්‍යාපෘති ණය ආධාර වැඩසටහන් අවසන් වෙනතුරු මම නව නිවාස ණය ආධාර හෝ නිවාස ව්‍යාපෘති ආරම්භ කරන්නේ නෑ. තියෙන ව්‍යාපෘති අවසන් කරලා මිසක් අලුතින් වැඩසටහන් හඳුන්වා දෙන්න මගේ සූදානමක් නෑ.

> " ස්වයං මූල්‍ය ක්‍රමවේදය යටතේ තාවකාලිකව නතර වී ඇති සංවර්ධන ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමට පියවර. "

කටුරු ආරම්භ කළත් අපි හොඳ දේ ඉදිරියට ගෙනි යන්න ඕනෑ. දැනට ක්‍රියාත්මක ණය ආධාර සහ ව්‍යාපෘති අවසන් කළාට පස්සේ අපි මේ පිළිබඳව නැවත සමාලෝචනයක් කරනවා. එහෙම සමාලෝචනයක් කරලා පසුගිය කාලයේ මේ විෂයය භාරව සිටි බැති ඇමතිවරුන් ක්‍රියාත්මක කළ හොඳ වැඩසටහන් ඉදිරියට ගෙනි යන්න මම බලාපොරොත්තු වෙනවා.

> " ආර්ථික අර්බුදය නිසා තාවකාලිකව නතර වී ඇති නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන ව්‍යාපෘති ලබන වසර මුල වන විට යළි ආරම්භ කිරීමට හැකි වනු ඇතැයි අපි විශ්වාස කරනවා. "

රටේ තිබෙන ආර්ථික අර්බුදය නිසා ජනතාව දැන් හොඳටම පීඩාවට පත්වෙලා ඉන්නේ. එක නගර කිරීමේ වගකීම තියෙන්නෙත් අපිටමයි. ඒ නිසා අපි හැමෝම පක්ෂ පාට භේදයෙන් තොරව එකතුවෙලා වැඩ කරන්න ඕනේ. අපේ අමාත්‍යාංශයට අදාළව පක්ෂ විපක්ෂව ඕනෑම කෙනෙක් ඉදිරිපත් කරන සාධනීය යෝජනා ක්‍රියාත්මක කරන්න මම ඉතා කැමැත්තෙන් සිටින බව අවධාරණය කරනවා.



One Stop Unit නමින් සේවා මධ්‍යස්ථානය බත්තරමුල්ල, සෙත්සිරිපායේ පිහිටි අමාත්‍යාංශ පරිශ්‍රයේදී පසුගියදා ආරම්භ කෙරුණි.

මෙම නව ක්‍රමවේදය මඟින් සංවර්ධන බලපත්‍ර සඳහා අවශ්‍ය සියලුම අනුමැතීන් එක් ස්ථානයකින් කඩිනමින් ලබාගැනීමට හැකියාව පවතියි.

(ඡායාරූප - කළින් හේවාපතිරණ)

## නිවාස ණය අයකර ගැනීමෙන් නිවාස අධිකාරියට නොවැම්බර් මාසයේ රු. මි. 300 ඉක්මවූ ආදායමක්....

(නිහාර චාමික පෙරේරා)

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නොවැම්බර් මාසයට අදාළව නිවාස ණය අයකර ගැනීම හා දේපළ බැහැර කිරීමෙන් රුපියල් මිලියන 303ක ආදායමක් උපයා ගැනීමට හැකියාව ලැබී ඇතැයි එහි සභාපති රජිව් සූරියආරච්චි මහතා පවසයි.

ඔහු සඳහන් කරන්නේ රටතුළ පැවැති අරගලකාරී තත්ත්වය හා ආර්ථික අර්බුධය හේතුවෙන් පසුගිය මාර්තු මාසයෙන් පසුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ණය අයකර ගැනීම බොහෝ සෙයින් පහත වැටී තිබූ බවයි.

ඒ අනුව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් මත ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සියළුම දිස්ත්‍රික් කළමණාකරුවන් මහතුවරට කැඳවා මසකට රුපියල් මිලියන 300ක ණය මුදලක් එකතු කර ගැනීමේ ඉලක්කය ලබාදී ඒ සඳහා නව සැලැස්මක් හඳුන්වාදුන් බවත් සභාපතිවරයා සඳහන් කළේය.

එම වැඩපිළිවෙළින් පසුව ණය අයකර ගැනීම ක්‍රමයෙන් වර්ධනය කර ගැනීමට හැකියාව ලැබුණු බවද කීය. රට මුහුණදී තිබෙන ආර්ථික අර්බුදය හමුවේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආදායම මෙලෙස වර්ධනය වීම ඉතා විශාල ජයග්‍රහණයක් බවද හෙතෙම පැවසීය.

මෙම මාසයේදීත් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය රුපියල් මිලියන 300 ඉක්මවූ ආදායමක් අපේක්ෂා කරන බව කී සභාපතිවරයා ලබන වසරේදීත් ආදායම් තත්ත්වය මෙලෙසින්ම පවත්වා ගැනීමට අවශ්‍ය සැලසුම් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය දැනටමත් සකස් කොට අවසන් බවද කීය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සේවක වැටුප් හා අනෙකුත් වියදම් සඳහා රුපියල් මිලියන 150කට ආසන්න මුදලක් වැයවේ. එහෙත් දැනට ලැබෙන ආදායම අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මහා භාණ්ඩාගාරයට බරක් නොවී පවත්වා ගෙන යෑමට හැකියාව පවතින බවද සභාපතිවරයා සඳහන් කරයි.

එමෙන්ම මෙවර අයවැයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට රුපියල් මිලියන 3750ක මුදලක් වෙන්ව ඇති බවත් එම මුදලින් රුපියල් මිලියන 2750කට ආසන්න මුදලක් මේ වනවිට අතරමග නතරව ඇති ව්‍යාපෘති අවසන් කිරීමට වෙන් කිරීමට සිදුවන බවද හෙතෙම කීය.

එමෙන්ම අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිරියේදී ඩොලර් වලට නිවාස අලෙවිකිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමටද සැලසුම් කර ඇති බවද සභාපතිවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

## බුත්ගමුව ඇල දෙපස අනවසර පදිංචිකරුවන් 41 දෙනෙකුට නව නිවාස

(නාලක සංජීව දහනායක)

නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක මෝදර,හේනමුල්ල සත්සිරු සෙවණ නිවාස යෝජනා ක්‍රමයෙන් නිවාසලාභීන් 41 දෙනෙකු සඳහා නව නිවාස ලබාදීම නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති නිමේෂ් හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදුකෙරුණි.

එම පිරිස වසර 40ට ආසන්න කාලයක් අනවසරයෙන් පදිංචිව සිට ඇත්තේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ,514 වැලිකඩ නැගෙනහිර ග්‍රාමනිලධාරී වසමට අයත් බුත්ගමුව ඇල ඉවුර ආශ්‍රිතවය. එහිදී නිරන්තරයෙන් සිදුවන සංවතුර ආපදාවන් හේතුවෙන් ඔවුනු දැඩි පීඩාවකට පත්වූහ.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඔවුන්ට හේනමුල්ල, සත්සිරු සෙවණ නිවාස යෝජනා ක්‍රමයෙන් නිවාස ලබාදීමට පියවර ගනු ලැබිණ.



වර්ග අඩි 450ක විශාලත්වයකින් යුතු මෙම එක් නිවසක වටිනාකම රුපියල් ලක්ෂ 80කට ආසන්නය. එහෙත් නිවසක් ලබාදෙනු ලබන්නේ රුපියල් ලක්ෂ 15ක මුදලකටය. එම මුදලද වාරික 300කින් ගෙවීමට නිවෙස් හිමියාට පහසුකම් සලසා දී තිබේ.

එහිදී නිවෙස් හිමියා මාසිකව එක් වාරිකයක් සඳහා රුපියල් 5000 බැගින් වසර 25ක කාලයක් ගෙවිය යුතුය. අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි මෙම නිවාස ලාභීන් 41 දෙනාගේ ජීවන තත්ත්වය නගා සිටුවීමටද විශේෂ වැඩ සටහන් ගණනාවක්ම ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඇතැයි නාගරික සංවර්ධන අධිකාරිය සඳහන් කරයි.

(ඡායාරූපය - නුවන් ළහේන්ද්‍ර)

# මැති මත



## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය ඇතුලු ඊට අදාළ ආයතන සම්බන්ධව 2023 අය-වැය කාරක සභා අවස්ථා විවාදයේ දී ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ දී දැක්වූ අදහස්


(සැකසීම - නාලක සංජීව දහනායක)



**කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නලින් බණ්ඩාර (ස.ජ.බ) -** පාර්ලිමේන්තුවේ මාදිවෙල පිවිසුම ආයතනයේ වටිනා භූමියක් කුරුළු උයනකට දීල තියෙනවා. ඒක දුන්නේ කොහොමද?



**නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු (ශ්‍රී.ල.පො.පෙ)-** මාදිවෙල කුරුළු උද්‍යානය දී තියෙන්නේ තියෙන ප්‍රසම්පාදන ක්‍රියාවලියකට අනුවයි. එහි කිසිම ඉදිකිරීමක් කරන්න බැහැ.



**බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී චමින්ද විජේසිරි (ස.ජ.බ) -** ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයන්ගේ ගෙවල් ගිණි තිබ්බා. ඒ ගිණි තැබීම මම අනුමත කරන්නෙ නැහැ. මන්ත්‍රීවරුන්ට කළුබෝවිලින් ෆ්ලැට් එකක් දුන්නා. ලක්ෂ 400යි. මම නම් පිටින් කියන්නම්. අපිට ඕක නෑ. ගෙවල් ගිනි තිබ්බ පවුලිය ගත්තට කමක් නෑ. ගිනි ගත්ත ගෙවල් හදන්න සල්ලි දුන්නා. මැදිවෙලත් ගෙවල් තියෙනවා.



**ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, අමාත්‍ය ප්‍රසන්න රණතුංග (ශ්‍රී.ල.පො.පෙ)-** වියත්පුර නිවාස තියෙන්නෙ මගේ අමාත්‍යාංශය යටතේ. විපක්ෂයෙත් 30ට වැඩි මන්ත්‍රීවරුන් 76 දෙනෙකුට අවුරුද්දක කුලී පදනම යටතේ ඒ නිවාස ලබාදී තිබෙනවා. කිසිම මන්ත්‍රීවරයෙකුට නිකන්ගෙන් දීල නැහැ. ඕනම කෙනෙකුට ඒ ගෙවල් මුදලට ගන්න පුළුවන්. ඒ වගේම නිවාස ගිනි තැබීමට ලක්වූ මන්ත්‍රීවරුන්ට සත පහක් දීල නැහැ. වැරදි තොරතුරු සමාජයට දෙන්න එපා. ඇත්ත කියන්න. කැමැති අවශ්‍යනම් දැනට කමක් ඉන්න වියත්පුර නිවාස ඒ මන්ත්‍රීවරුන්ට මුදලට ගන්න පුළුවන්.



**ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නාලක ගොඩහේවා (ශ්‍රී.ල.පො.පෙ ස්වාධීන) -** නාගරික සංවර්ධන අමාත්‍යාංශය තියෙන්නේ ප්‍රතිලාභ නැතිනම් අමාත්‍යාංශයක්. මෙවර අයවැයෙන් නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු ආයතනවලට වෙන්කරල තියෙන්නේ අඩු මුදලක්.



**විපක්ෂනායක සජිත් ප්‍රේමදාස -** ගරු සභානායකතුමනි, "සිවුරු ඇඳගත්ත පිරිසට" යනුවෙන් මහා සංඝරත්නය ආමන්ත්‍රණය කිරීම නුසුදුසුයි. මේ කතාව නිසා මහා සංඝරත්නය ලොකු කලකිරීමකට පත්වුණා. ඒක කියන විදියක් තියෙනවා. අපි මහා සංඝරත්නයටත්, චීවරයටත් සලකන්න ඕන. මහා සංඝරත්නය විවේචනය කරන්න, වාද විවාද කරන්න යන්න හොඳ නැහැ.



**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු (ශ්‍රී.ල.පො.පෙ)-** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට මෙවර අයවැයෙන් රුපියල් මිලියන 48491ක් වෙන්කරලා තියෙනවා. මේ රටේ ආර්ථිකය ගොඩගන්න අපි වැඩ කරනවා.



**ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, අමාත්‍ය ප්‍රසන්න රණතුංග (ශ්‍රී.ල.පො.පෙ) -** විපක්ෂනායකතුමනි, අපි මහා සංඝරත්නයට අපහාස කළේ නැහැ.නමුත් ඔබතුමන්ලා මහාවාදයක් හදන්න හදනවා. ස්වාමීන් වහන්සේලා කරන යම් යම් කාරණා ගැන මහා නායකහිමිවරුන් කතා කරනවා. මගේ නිවස ගිනි තියන්න එක ස්වාමීන් වහන්සේ නමක් මැදිහත් වුණා. නමුත් මම කිව්වේ එක හාමුදුරු නමක් එහෙම කරාට හැමෝම එහෙම නෑ කියලයි. අපි මහා සංඝරත්නයට ගරු කරනවා.

**ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා (ශ්‍රී.පො.පෙ) -** මම කතා කරන්නේ සියලුම ඉදිකිරීම් ශිල්පීන් ගැනයි. මම කතා කරන්නේ මගේ අමාත්‍යාංශයේ ඉදිකිරීම් ශිල්පීන් ගැනයි. ඒ අයගේ ගෙවීම් ලබන අවුරුද්දේ ගෙවන්න අපි කටයුතු සූදානම් කර තිබෙනවා.අපිත් යෝජනා කරන්නෙ විදේශ රටවල ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව ඉල්ලීම් කරන්න කියලයි. ඒ සඳහා සභාපති කාර්යාල හරහා මැදිහත්වීම අපි කරනවා. දැනටමත් බුතානි රාජ්‍ය සමඟ සාකච්ඡා කරනවා.



**කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.එම් මරික්කාර් (ස.ජ.බ) -** යහපාලන ආණ්ඩුව කාලේ සජිත් ප්‍රේමදාස මහත්මයා [illegible] ගෙවල් හදන්න පටන් ගත්තා. අපිට ආණ්ඩුව නැතිවෙන කොට ගෙවල් හාරදහසක් විතර ඉවර කරගන්න බැරිවුණා. ගෙවල් දෙලක්ෂ ගාණක් ඉවර කරල තිබුණා. ආණ්ඩු මාරුවත් සමඟ අයවැයෙන් වෙන්වුණ මුදල් අරගෙන වසමකට එක ගෙයක් හදන්න පටන් ගත්තා. ඒක කළේ සජිත් ප්‍රේමදාස මහත්මයා ගෙවල් හැදුවේ නෑ කියල පෙන්වන්නයි.



**කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සුමිත් උඩුකුඹුර (ශ්‍රී.පො.පෙ) -** අපි නිවාස හදල දුන්නේ අවශ්‍ය පුද්ගලයන්ට පමණයි. ඒ නිවාස හදල මිනිස්සු පදිංචි කරද්දි [illegible] විවෘත කළේ නෑ. අනවශ්‍ය ප්‍රචාරක කටයුතු කළේ නෑ. රජයේ මුදල් අහිමි කරමින් තමයි ඒ වැඩ කළේ. නමුත් සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ කාලේ නිවාස විවෘත කිරීමේ උත්සව වෙනුවෙන් පුවත්පත් දැන්වීම් වෙනුවෙන් රුපියල් ලක්ෂ 3000ක්, සමරු කළාප හා ආරාධනා පත්‍ර වෙනුවෙන් රුපියල් ලක්ෂ 800ක් වියදම් කරල තියෙනවා.



**ජාතික ලැයිස්තු මන්ත්‍රී තිස්ස අත්තනායක (ස.ජ.බ) -** ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියුතුවූවන්ට රුපියල් බිලියන 200ක් විතර ලැබෙන්න තියෙනවා. ඒ වගේම විදේශගතව සමාජයේ වෙන්කිය කරගැනීමට අවශ්‍ය සහතික කිරීම් ලබාගැනීම ගැන ඔවුන් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දී සිටිනවා. එමෙන්ම විදේශගතවන්න වීසා පහසුකම් ලබාගැනීම හා විදේශ අමාත්‍යාංශයේ මැදිහත්වීම හා අඩුපාඩු ගැන කතා කළා. හිඟ ගෙවීම් ලබන වසරේ



**කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නලින් බණ්ඩාර (ස.ජ.බ) -** ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ භාණ්ඩාගාරික නියෝජ්‍යවරිය ලෙස කටයුතු කළ සිල්වා කියන අධ්‍යක්ෂකවරිය ඉල්ලා අස්වූ බව අපිට වාර්තා වුණා. ගරු ඇමතිතුමා මේ ගැන සභාව දැනුවත් කළොත් හොඳයි.



**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය [illegible] විදානගමගේ (ශ්‍රී.පො.පෙ) -** ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ හිටපු භාණ්ඩාගාරික අධ්‍යක්ෂතුමිය පෞද්ගලික හේතුවක් මත ඉල්ලා අස්වී තිබෙනවා. ඒ වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය විසින් නව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස ඩබ්ලිව්.ඒ. සරත් කුමාර මහතාව පත් කර තිබෙනවා.



அமைச்சர் பிரசன்ன ரணதுங்க பாராளுமன்றத்தில் ஆற்றிய உரை

# நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சின் செலவுத் தலைப்பு




(முனீரா அபூபக்கர்)

கோவிட் தொற்றுநோய் மற்றும் பொருளாதார நெருக்கடிக்கு முன்னர் இருந்ததை விட நகர அபிவிருத்தி மற்றும் வீடமைப்புத் துறையை உயர் மட்டத்திற்கு கொண்டு செல்வதே தனது நம்பிக்கை என நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சர் பிரசன்ன ரணதுங்க அண்மையில் பாராளுமன்றத்தில் தெரிவித்தார்.

தற்போதைய பொருளாதார நெருக்கடிக்கு முகங்கொடுக்கும் வகையில் பல்வேறு தடைகள் உள்ளபோதிலும் நவீன தொழில்நுட்பத்தை பயன்படுத்தி நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு தொழில்துறையை மேம்படுத்த தயாராக உள்ளதாகவும் அமைச்சர் குறிப்பிட்டார்.

நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சின் செலவுத் தலைப்பு தொடர்பான உரையை ஆரம்பித்து வைத்த அமைச்சர் பிரசன்ன ரணதுங்க இதனைக் குறிப்பிட்டார்.

**" கடந்த 2 மாதங்களில் டொலர்களின் மூலம் 6 வீடுகளை விற்பனை செய்துள்ளோம். இதன்படி இதுவரை 276,650 அமெரிக்க டொலர்கள் ஈட்டப்பட்டுள்ளன."**

அமைச்சர் மேலும் கூறியதாவது நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சின் செலவுத் தலைப்புகள் 123, 291, 309 முதல் 311 வரை இன்று நாம் விவாதிக்கப் போகிறோம்.

தற்போதைய நிலையில் இவ்வருட வரவு செலவுத் திட்டத்தில் இந்த அமைச்சுக்கு 48,491 மில்லியன் ரூபா ஒதுக்கப்பட்டுள்ளது. தொடர் செலவினமாக 2,744 மில்லியன் ரூபா ஒதுக்கப்பட்டுள்ளது. மொத்தத்தொகையிலிருந்து 43,740 மில்லியன் ரூபாவை அபிவிருத்தி நடவடிக்கைகளுக்காக ஒதுக்கியுள்ளோம். நகர அபிவிருத்தி திட்டங்களுக்கு 20,433 மில்லியன் ரூபாவும், வீடமைப்பு அபிவிருத்தி திட்டங்களுக்கு 16,057மில்லியன் ரூபாவும், கழிவு முகாமைத்துவம் மற்றும் சுற்றாடல் பாதுகாப்பு திட்டங்களுக்கு 7,250 மில்லியன்ரூபாவும் ஒதுக்கப்பட்டுள்ளது. இந்த அமைச்சின் கீழ் உள்ள 4 திணைக்களங்களுக்கு 2007 மில்லியன் ரூபா ஒதுக்கப்பட்டுள்ளது.

கோவிட் தொற்றுநோய்க்கு பிந்தைய சூழ்நிலை மற்றும் பொருளாதார நெருக்கடியால் சரிந்த நிர்மாணத்துறையை காப்பாற்றுவது எங்களுக்கு இருந்த முதல் சவால். இந்தத் துறையில் சுமார் 10 லட்சம் பேர் நேரடியாகவும், மறைமுகமாகவும் வேலை செய்து வருகின்றனர். இறக்குமதி கட்டுப்பாடுகள், விநியோகம் மற்றும் போக்குவரத்து தாமதங்கள், வங்கி வசதி கட்டுப்பாடுகள், ரூபாய் மதிப்பு சரிவு, எரிபொருள் விலை, கட்டுமானப் பொருட்களின் பற்றாக்குறை போன்ற விஷயங்கள் இந்தத் துறையின் வீழ்ச்சிக்கு வழிவகுத்தன.

இதனால் 2020 மார்ச் முதல் 2022 டிசம்பர் இறுதி வரை நிர்மாணத்துறை தொழிலில் ஈடுபடுவோருக்கு சலுகை வழங்கப்படும். இந்த சலுகைகளை அடுத்த ஆண்டு (2023) டிசம்பர் வரை நீட்டிக்க நடவடிக்கை எடுத்து வருகிறோம். விரைவில் அதற்காக அமைச்சரவையில் அமைச்சக் குறிப்பை சமர்ப்பிப்பேன் என நம்புகிறேன்.

நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சின் கீழ் மேற்கொள்ளப்படும் நிர்மாணங்களுக்கான தாமதமான கொடுப்பனவு 12 பில்லியன் ரூபாவை அண்மித்துள்ளது. நெடுஞ்சாலை நிர்மாணத்துறை ஒப்பந்ததாரர்களும் அதே தொகையை செலுத்த வேண்டியுள்ளது. நமது வீடமைப்பு அமைச்சின் கீழ் செலுத்த வேண்டிய இந்தத் தொகை முறையாகவும், இடையிடையேயும்செலுத்தப்பட்டு வருகிறது.

**"நிர்மாணத்துறை தொழிலாளர்களுக்கு தொழில்சார் அடையாள அட்டை வழங்கப்படுவதை 3 வருடங்களுக்குள் எல்லா மாவட்டங்களிலும் செயற்படுத்த எதிர்பார்த்துள்ளோம்."**

எமது அமைச்சின் கீழுள்ள சீடா நிறுவனம் (நிர்மாணத்துறை அபிவிருத்தி அதிகார சபை) நிர்மாணத்துறையின் முன்னேற்றத்திற்காக பல நடவடிக்கைகளை எடுத்துள்ளது. அதன்படி நிர்மாணத்துறை தொழிலாளர்களுக்கு தொழில்சார் அடையாள அட்டை வழங்கப்படுகிறது. இதன் காரணமாக அவர்களின் பணிப் பாதுகாப்பும் உருவாக்கப்பட்டுள்ளது. எதிர்வரும் ஆண்டில் நாடளாவிய ரீதியில் அனைத்து மாவட்டங்களையும் உள்ளடக்கிய வகையில் இந்த வேலைத்திட்டத்தை முன்னெடுக்கவுள்ளோம்.

இன்று நாடு எதிர்நோக்கும் பொருளாதார நெருக்கடியின் அடிப்படைப் பிரச்சனை டொலர் பற்றாக்குறை. நமது அமைச்சு டொலர் சம்பாதிக்கும் அமைச்சு அல்ல. ஆனால் தற்போதைய சூழ்நிலையில் அமைச்சு என்ற ரீதியில் எம்மால் என்ன செய்ய முடியும் என புதிதாக சிந்தித்தோம்.

நகர அபிவிருத்தி அதிகாரசபையானது இதுவரை 12 நடுத்தர வர்க்க வீட்டுத்திட்டங்களை நடைமுறைப்படுத்தியுள்ளது. அதன் கீழ், 3,667 வீடுகள் கட்டப்பட்டு வருகின்றன. அதன்படி வெளிநாடுகளில் உள்ள இலங்கையர்களுக்கும் வெளிநாடுகளில் பணிபுரியும் எமது மக்களுக்கும் டொலர்களுக்கு வீடுகளை விற்பனை செய்யும் செயற்திட்டமொன்றை அறிமுகப்படுத்தினோம். இரட்டைக் குடியுரிமை மற்றும் நிரந்தர விசாவில் வெளிநாடுகளில் வசிக்கும் இலங்கையர்களுக்கு இந்த வீடுகளை வாங்குவதற்கான வாய்ப்பை வழங்குவதற்கும் நாங்கள் உழைத்தோம். நீங்கள் இந்த வீடுகளை டொலர்களில் வாங்கினால், நாங்கள் உங்களுக்கு 10% தள்ளுபடி தருகிறோம். இந்த நோக்கத்திற்காக, நாங்கள் ஒரு டொலர் கணக்கை அமைக்க நடவடிக்கை எடுத்தோம்.

கடந்த இரண்டு மாதங்களில் 06 வீடுகளை விற்பனை செய்துள்ளோம். இதன்படி இதுவரை 276,650 அமெரிக்க டொலர்கள் ஈட்டப்பட்டுள்ளன. விற்பனை செய்யப்பட்ட அனைத்து வீடுகளும் வியத்புர வீட்டுத் திட்டத்தில் உள்ளவை. துபாய், அமெரிக்கா, கனடா, கட்டார் போன்ற நாடுகளில் பணிபுரியும் இலங்கையர்களே இவற்றை கொள்வனவு செய்துள்ளனர். வெளிநாடுகளில் உள்ள மேலும் 10 இலங்கையர்கள் இந்த வீடுகளை வாங்க விண்ணப்பித்துள்ளனர்.

நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சின் கீழ் தான் கடலோரப் பாதுகாப்புத் திணைக்களமும் உள்ளது. தீவைச் சுற்றியுள்ள கடற்கரைகளில் 24 புதிய சுற்றுலாத் தளங்களை நாங்கள் புதிதாகக் கண்டறிந்துள்ளோம். சுற்றுலாத் துறை அமைச்சகத்துடன் இணைந்து, இந்த சுற்றுலாத் தலங்களைப் பற்றி சுற்றுலாப் பயணிகளுக்குப் பரவலான விளம்பரம் அளிக்கும் திட்டத்தைத் தயாரித்து வருகிறோம்.

நமது நாட்டிற்குச் சொந்தமான 113 தீவுகள் உள்ளன. வடகிழக்கு பிராந்தியங்களில் மட்டும் 76 தீவுகள் உள்ளன. இந்த தீவுகளில் பல்வேறு சமூகங்கள் வாழ்கின்றன. அவர்கள் தங்கள் சொந்த துணை கலாச்சாரங்களைக் கொண்டுள்ளனர். இந்த தீவுகளை அபிவிருத்தி செய்வதற்காக தீவு அபிவிருத்தி அதிகாரசபை என்ற புதிய நிறுவனத்தை நிறுவுவதற்கு அமைச்சரவை பத்திரத்தை சமர்ப்பித்தேன்.

நகர அபிவிருத்தி அதிகாரசபை 24 மாநகர சபைகள், 41 நகர சபைகள், 208 பிராந்திய சபைகள், நகர அபிவிருத்தி பிரதேசங்களாக பிரகடனப் படுத்தியுள்ளது. இந்தப் பிரதேசங்களில் அனைத்து அபிவிருத்தி நடவடிக்கைகளுக்கும் அனுமதி வழங்குவதற்கு நகர அபிவிருத்தி அதிகாரசபைக்கு அதிகாரம் உள்ளது.

இந்த நிலைமையை கருத்தில் கொண்டு அபிவிருத்தி அனுமதிகளை விரைவாக வழங்கும் வேலைத்திட்டத்தை ஆரம்பித்தோம். அதற்கு ஒன் ஸ்டாப் யூனிட் என்று (விரைவு சேவை பிரிவு)பெயரிட்டோம். இந்த அலகு 03 கட்டங்களின் கீழ் இயங்குகிறது. முதற்கட்டமாக கொழும்பு மாவட்டத்திலும் இரண்டாம் கட்டத்தின் கீழ் கொழும்பு மாநகர சபைக்குள் நகர அபிவிருத்தி அதிகாரசபையின் அனைத்து மாவட்ட அலுவலகங்கள் மற்றும் அனைத்து உள்ளூராட்சி மன்றங்களையும் உள்ளடக்கிய வகையில் இதனை நடைமுறைப்படுத்த எதிர்பார்க்கின்றோம்.

**"நகர அபிவிருத்தி அதிகாரசபை ஊடாக காணி வங்கியை தயார்படுத்தும் பணியில் ஈடுபட்டுள்ளோம்"**

இந்த திட்டத்துடன், நகர அபிவிருத்தி அதிகாரசபையின் காணி வங்கியை தயார்படுத்தும் பணிகளில் ஈடுபட்டுள்ளோம். நகர அபிவிருத்தி அதிகாரசபைக்கு சொந்தமான நாட்டின் முக்கிய நகரங்களில் சுமார் 1008 ஏக்கர் நிலம் மற்றும் அதிக சந்தை பெறுமதியுடன் கட்டிடங்கள் உள்ளன, அவை தற்போது அதிகபட்ச சாத்தியக்கூறுகளுக்கு பயன்படுத்தப்படவில்லை.

கடந்த காலங்களில் நகர அபிவிருத்தி அதிகாரசபையின் கீழ் பல்வேறு திட்டங்கள் நடைமுறைப்படுத்தப்பட்டன. கோவிட் தொற்றுநோய் மற்றும் பொருளாதார நெருக்கடி காரணமாக, நாங்கள் சில திட்டங்களை தற்காலிகமாக நிறுத்தி வைக்க வேண்டியிருந்தது. ஆனால் நாங்கள் திட்டங்களை வகுப்பதை நிறுத்தவில்லை. 272 நகர்ப்புறங்களில் 70 பகுதிகளுக்கான திட்டங்கள் இதுவரை தயாரிக்கப்பட்டுள்ளன. அடுத்த வருடத்திற்குள் 272 நகரப் பகுதிகளுக்கான நகரத் திட்டங்களைத் தயாரித்து வர்த்தமானியில் வெளியிடுவோம் என்று நம்புகிறோம்.

**"தற்போதைய பொருளாதார நெருக்கடி காரணமாக தற்காலிகமாக நிறுத்தப்பட்டுள்ள நகர அபிவிருத்தி அதிகாரசபையின் அபிவிருத்தித் திட்டங்களை அடுத்த வருட தொடக்கத்தில் மீள ஆரம்பிக்க முடியும் என நம்புகின்றோம்."**

இலங்கையின் அனைத்துப் பிரதேசங்களையும் உள்ளடக்கிய 117 சிறிய மற்றும் நடுத்தர நகர மையங்களைத் தெரிவுசெய்து அவற்றின் அடிப்படைப் பொதுத் தேவைகளை மேம்படுத்துவதற்கு நூறு நகரங்கள் திட்டத்தை நாங்கள் நடைமுறைப்படுத்தினோம். அடையாளம் காணப்பட்ட 117 நகரங்களில் 116 நகரங்களில் திட்டங்கள் தொடங்கப்பட்டுள்ளன. 110 நகரங்களில் பணிகள் நிறைவடைந்துள்ளன. இந்த திட்டத்தில் பல்வேறு சிக்கல்கள் இருக்கலாம். பிரச்னைக்குரிய பகுதிகளை

கண்டறிந்து, எதிர்காலத்தில் அவற்றை சரிசெய்ய முயற்சிப்போம்.

நாட்டின் ஏற்பட்டுள்ள பொருளாதார நெருக்கடியினால் மக்கள் தற்பொழுது மிகவும் மன உளைச்சலுக்கு உள்ளாகி இருக்கின்றனர். அதனை தடுக்க நாமே செயற்பட வேண்டும். ஆதனால் நாம் அனைவரும் ஒன்றிணைந்து செயற்பட வேண்டும். எமது அமைச்சுக்கு தொடர்புடைய அரசுக் கட்சி எதிர்கட்சிஉறுப்பினர்கள் யாராக இருந்தாலும் முன்வைக்கும் சிறந்த ஆலோசனைகளை நடைமுறைப்படுத்த நாம் மிகவும் விருப்பத்

# රජයේ මූල්‍ය පහසුකම් ලැබෙනතුරු ස්වයං මූල්‍යකරණ යාන්ත්‍රණය හරහා නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමට පියවර

(තාලක සංජීව දහනායක)

රජයේ මූල්‍ය පහසුකම් ලැබෙනතුරු ස්වයං මූල්‍යකරණ යාන්ත්‍රණය හරහා නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යන ලෙසට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා නිලධාරීන්ට උපදෙස් දෙයි. මේ වනවිට රට මුහුණදී තිබෙන ආර්ථික අර්බුදය හේතුවෙන් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ සිදු කෙරෙන ඇතැම් නිවාස ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු තාවකාලික පසුබෑමකට ලක්ව තිබීම ඊට හේතුවයි.

අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් දුන්නේ ජාතික මට්ටමින් අතිශයින්ම වැදගත් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබෙනතුරු ස්වයං මූල්‍ය යාන්ත්‍රණයක් හරහා මුදල් වෙන්කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු බවයි.

කොළඹ නගරයේ අඩු පහසුකම් සහිත ජනතාවගේ නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේ අරමුණින් නාගරික සංවර්ධන අධිකාරිය නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ 2010 වසරේදීය.

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මගින් නිවාස ඒකක 50,000ක් ඉදිකිරීමට නියමිත අතර ඒ සඳහා රුපියල් මිලියන 190,054ක මුදලක් වැය කිරීමට නියමිතය.

ලබන වසරේදී තුරුණුගල සහ මහරගම නිවාස ඒකක 900ක් ස්වයං අරමුදල් යාන්ත්‍රණයෙන් ඉදිකිරීමට යෝජිතය. ඊට අමතරව දැනට ක්‍රියාත්මක කොළඹගේ මාවත සහ ටොරින්ටන් මාවත නිවාස ව්‍යාපෘති අඛණ්ඩව පවත්වාගෙන යාමටද නියමිතය.

මේ වනවිටත් නාගරික පුනර්ජීවන වැඩසටහන යටතේ දෙමටගොඩ - මිහිඳුසෙන්පුර, ඕරුගොඩවත්ත-පුරදොර සෙවණ, බොරැල්ල-සිරිසර උයන, මාලිගාවත්ත-ලක්සෙත සෙවණ, බ්ලූමැන්ඩල්-සිරිසඳ සෙවණ වැනි නිවාස ව්‍යාපෘති 22ක වැඩ අවසන්කර ඇති අතර ඒ යටතේ නිවාස ඒකක 13,814ක වැඩ සම්පූර්ණයෙන්ම අවසන් කර තිබේ.

මේ වනවිට රට මුහුණදී තිබෙන ආර්ථික අර්බුදය හේතුවෙන් තවත් නිවාස ඒකක 786ක ඉදිකිරීම් කටයුතු විවිධ අදියරවල පවතී. එලෙස ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින්නේ 601 වත්ත හා කොළොන්නාව නිවාස ව්‍යාපෘති දෙකය.

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය අවසන්වූ පසුව ඉඩම් අක්කර 400ක් වාණිජ අරමුණු වෙනුවෙන් නිදහස් කෙරෙන බවද නාගරික සංවර්ධන අධිකාරිය සඳහන් කරයි. ප්‍රතිසංවර්ධන කටයුතු සඳහා දැනටමත් ආසන්න වශයෙන් ඉඩම් අක්කර 116ක් නිදහස් කර තිබේ.

නගර සංවර්ධන සැලසුම් අරමුණු සපුරාලීම සඳහා පිළිගත හැකි ප්‍රමිතීන් සහිත නව නිවාස යෝජනා ක්‍රමවල මෙම පවුල් නැවත පදිංචි කිරීම, පිරිසිදු හා ප්‍රසන්න වාතා-වරණයක් සහිත ලොව පිළිගත් නගරයක් බවට කොළඹ නගරය පත්කිරීම මෙම නාගරික පුනර්ජීවන වැඩ සටහනේ තවත් එක් අරමුණකි.

මෙවර අයවැයෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට රුපියල් මිලියන 48,491ක මුදලක් වෙන්ව ඇත. එම සමස්ත මුදලින් රුපියල් මිලියන 43,740ක් සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වෙන්කර ඇති අතර තවත් රුපියල් මිලියන 20,433ක් නාගරික සංවර්ධන වැඩසටහන් සඳහා වෙන්ව ඇත.

# භෞතික සම්පත් සංවර්ධනය සඳහා සිව්මහ නගර හඳුනා ගැනේ...

(නිහාර වාමික පෙරේරා)

භෞතික සම්පත් සංවර්ධනය සඳහා සිව්මහ නගර ලෙස කොළඹ, හම්බන්තොට, ත්‍රිකුණාමලය සහ යාපනය නගර හඳුනා ගැනේ. එම නගර යා කරමින් ආර්ථික කොරිඩෝ 9 ක් ද හඳුනා ගෙන ඇතැයි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි. ඔහු පෙන්වා දෙන්නේ මෙම නගර සංවර්ධන කටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් අදාළ අංශ වෙත ලබා දී ඇති බවයි.

මෙරට ප්‍රධාන වාණිජ හා මූල්‍ය නගරය ලෙස කොළඹ නගරය හඳුනා ගෙන තිබේ. ඉදිරි වසර 8 සඳහා කොළඹ නගර සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරිය දැනටමත් ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇත. ඒ යටතේ කිරිමණ්ඩල මාවත නගර සංවර්ධන ව්‍යාපෘතිය හා නාගරික පුනර්ජීවන නිවාස ව්‍යාපෘති දැනටමත් ක්‍රියාත්මකයි. බොරැල්ල නගර සංවර්ධන සැලසුම සකස් කරමින් පවතී.

හම්බන්තොට නගරය සංවර්ධනය කිරීම සඳහා සැකසුනු හම්බන්තොට විසල් නගර සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීමට අපේක්ෂිතයි. එම සැලැස්ම යටතේ හඳුනා ගන්නා ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, වරාය, මත්තල ගුවන්තොටුපල, විශේෂ කලාපීය උද්භිද උද්‍යානය සහ පරිපාලන සංකීර්ණය මේ වන විටත් ඉදිකර අවසන්ව තිබේ. නව ව්‍යාපෘති ලෙස බැංකු කලාපීය ව්‍යාපෘතිය සහ කරීසල් චතුරශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතයි.

ත්‍රිකුණාමල නගරය ප්‍රධාන වාණිජ නගරයක් ලෙස හඳුනා ගෙන පළාත් පාලන ආයතන කිහිපයක් ඇතුලත් වන පරිදි ත්‍රිකුණාමලය නගර සංවර්ධන සැලැස්ම සැකසීම මේ වන විට ආරම්භ වී තිබේ. ඒ අනුව ත්‍රිකුණාමලය වරාය සංවර්ධනය, තෙල් පර්යන්තය සංවර්ධනය සහ කප්පල්තුරේ කර්මාන්ත කලාපය සංවර්ධනය කිරීමට අපේක්ෂිතයි. ඊට අදාලව අදාල ආයතන සමග සාකච්ඡා කර සැලසුම් සකස් කිරීමට කටයුතු යොදා තිබේ.

යාපනය අභිවෘද්ධිය සඳහා ද සංවර්ධන සැලැස්මක් මේ වන විට සැකසෙමින් පවතින බව ඇමති ප්‍රසන්න රණතුංග මහතා කියයි. මේ යටතේ කන්කසන්තුරේ නගර සංවර්ධනය, වරාය සංවර්ධනය, පලාලි ගුවන්තොටුපල පහසුකම් පුළුල් කිරීම, කර්මාන්ත හා තොරතුරු තාක්ෂණ සංවර්ධනය හා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතයි.

මෙම සිව්මහ නගර සංවර්ධන ව්‍යාපෘති වලට සමගාමීව දඹුල්ල, නුවර හා ගාල්ල සංවර්ධන කටයුතු ද ආරම්භ කර තිබේ. ගාල්ල සංවර්ධන සැලැස්ම ඒ යටතේ ගැසට් මගින් දැනටමත් ප්‍රකාශයට පත් කර තිබේ. ගාල්ල කොටුව තැපැල් කාර්යාලය ප්‍රතිසංවර්ධනය කිරීම, මිලුවගොඩ පාරිසරික කෘෂිකර්මික සංවර්ධන ව්‍යාපෘතිය සහ ගාල්ල මධ්‍යයේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය ද දැනටමත් ක්‍රියාත්මකයි.


නුවර සංවර්ධනය යටතේ බෝගම්බර සංචාරක හා සංස්කෘතික සංවර්ධන මධ්‍යස්ථානය, ගැටඹේ මධ්‍යම පාන්තික නිවාස සංකීර්ණය, කටුගස්තොට තොග වෙළඳ මධ්‍යස්ථාන සංවර්ධන ව්‍යාපෘතිය, ගන්නෝරුව අධ්‍යාපනික කේන්ද්‍රයක සංවර්ධන ව්‍යාපෘති සහ තවත් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් හඳුනා ගෙන තිබේ. දඹුල්ල සංවර්ධන සැලසුම ලබන වසරේ මුල් කාර්තුව තුළ ගැසට් කිරීමට නියමිතයි. මේ යටතේ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය, සීගිරිය සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය, දඹුල්ල ඉනාමළුව සීගිරිය හරහා හබරණ දක්වා ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම, හබරණ සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය, ගල්වෙල විකල්ප මාර්ග ව්‍යාපෘතිය සහ නාවුල මහජන ක්‍රීඩාංගනය නවීකරණය කිරීම සිදු කෙරෙනු ඇත.

ඇමති ප්‍රසන්න රණතුංග මහතා පවසන්නේ පවතින ආර්ථික තත්වය මත තාවකාලික පසුබෑමකට ලක්ව ඇති මෙවැනි මහා පරිමාණ ව්‍යාපෘති ලබන වසර තුළ කඩිනම් කරන බවයි. ඒ සඳහා මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර ඇති බවත්, ඊට ජනාධිපති-වරයාගේද එකඟත්වය පළව ඇති බවත් ඇමති ප්‍රසන්න රණතුංග මහතා වැඩිදුරටත් කියා සිටී.









# නිවාස 11 ක් ඩොලර් වලින් අළෙවි වේ...

## නිවාස හය විකිණීමේ ආදායම ඇමරිකානු ඩොලර් 502,170.93 යි...

(නිහාර චාමික පෙරේරා)

නාගරික සංවර්ධන අධිකාරියේ මධ්‍යම පාන්තික නිවාස ඩොලර් වලට අළෙවි කිරීමේ වැඩපිළිවෙල යටතේ මේ වනවිට ඇමරිකානු ඩොලර් ලක්ෂ 5කට වැඩි ආදායමක් උපයාගෙන ඇතැයි නාගරික සංවර්ධන අධිකාරිය කියයි.

ඒ අනුව උපයාගෙන ඇති මුදල ඩොලර් 502,170.93 කි. එය මෙරට මුදලින් රුපියල් මිලියන 181.2 කි. මේ වසරේ ඩොලර් වලින් නිවාස අළෙවි කොට ලබා ගැනීමට අපේක්ෂා කළ ආදායම ඩොලර් ලක්ෂ 05 කි. වසර අවසන් වීමටත් පෙර එම ඉලක්කය ඉක්මවා යාමට හැකි වූ බව නාගරික සංවර්ධන අධිකාරිය සඳහන් කරයි.

### තවත් නිවාස 8ක් මිලදී ගැනීමට ඉල්ලීම්"

මෙරට තිබෙන ඩොලර් අර්බුදයට විසඳුමක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර ඇති මධ්‍යම පාන්තික නිවාස විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට හා විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට අළෙවි කිරීමට පියවර ගැණුනේ විෂයභාර අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදියි. ඒ අනුව ඊට අදාළ පළමු නිවස පසුගිය සැප්තැම්බර් මාසයේදී අළෙවි විය. එය මිලදී ගත්තේ ඩුබායි රාජ්‍යයේ සිටින ශ්‍රී ලාංකිකයෙකි.

නාගරික සංවර්ධන අධිකාරිය පවසන්නේ මේ වනවිට නිවාස 11 ක් ඩොලර් වලට අළෙවි වී ඇති බවයි. එම නිවාස අළෙවි වී ඇත්තේ පන්නිපිටිය, විරමාවත්ත පිහිටි වියත්පුර නිවාස සංකීර්ණයෙනි. මේ වනවිට එම නිවාස සංකීර්ණයේ නිදන කාමර දෙකක් සහිත නිවාස සම්පූර්ණයෙන්ම විකිණී අවසන් බවද නාගරික සංවර්ධන අධිකාරිය පවසයි.

ඩුබායි, ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, එක්සත් රාජධානිය, ඕමාන් කටාර් රාජ්‍යය හා ෆිජි දූපත්වල ජීවත්වන ශ්‍රී ලාංකිකයන් මෙම නිවාස මිලදීගෙන තිබේ. නිවාසවල වටිනාකම එකවර ගෙවූ බැවින් ඔවුන්ට සියයට 10ක වට්ටම් දීමනාවක්ද හිමිව ඇත.

එමෙන්ම තවත් නිවාස 8ක් මිලදී ගැනීමට විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් ඉල්ලීම්කර ඇති බවද එම අධිකාරිය පවසයි. නාගරික සංවර්ධන අධිකාරිය සතු නිවාස විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට අළෙවි කිරීමෙන් ලබන වසරේදී ඇමරිකානු ඩොලර් මිලියන 1.5ක ආදායමක් උපයා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය දැනටමත් සැළසුම් සකස්කර තිබේ.

විදේශීය පුරවැසියන්ටද මෙම නිවාස මිලදී ගැනීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශ මත විවෘත කරනු ලබන විශේෂ ගිණුමක් වන අභ්‍යන්තර ආයෝජන ගිණුමක්ද (INWARD INVESTMENT ACCOUNT ) විවෘත කිරීමට කටයුතු යොදා තිබේ.

# සංචාරක ස්ථාන සංවර්ධනයට නාගරික සංවර්ධන අධිකාරියෙන් නව වැඩපිළිවෙලක්

(කාලක සංජීව දහනායක)


දිවයින පුරා පිහිටි ආකර්ෂණීය සංචාරක ස්ථාන සංවර්ධනය කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය ඉදිරිපත් වෙයි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ එක්ව එය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ එක්ව ඇල්ල, ආරුගම්බේ, නුවරඑළිය,කල්පිටිය සහ හික්කඩුව යන නාගරික ප්‍රදේශ සඳහා සංචාරක සංවර්ධන සැලසුම් සකස් කිරීමට දැනටමත් පියවර ගෙන තිබේ. ඒ අතරින් ඇල්ල සංචාරක සැළැස්ම දැනටමත් ගැසට් මගින් ප්‍රකාශයට පත්කර තිබේ. ආරුගම්බේ, කල්පිටිය, හික්කඩුව හා නුවරඑළිය සංචාරක සංවර්ධන සැලසුම් සකස් කිරීම අවසන් අදියරේ පවතින බව නාගරික සංවර්ධන අධිකාරිය පවසයි.

මේ අතර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මුළු දිවයිනම ආවරණය වන පරිදි වෙරළ තීරය ආශ්‍රිතව සමේ වාඩිය, සීනාගල්ල, නයාරු මිවි,ගවතාර් ඔිසිස්, වයික්කාල, කම්පල්හිට් මිට ඇතුළු අලුතින් සංචාරක ස්ථාන 24 ක් හඳුනා ගෙන තිබේ. මෙම ස්ථාන සංවර්ධනය කිරීම සඳහා ද නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ විශේෂ අවධානය යොමු ව ඇත.

ඇමති ප්‍රසන්න රණතුංග මහතා පවසන්නේ දෙන්නේ සංචාරක ආකර්ෂණීය ස්ථාන සංවර්ධනය කිරීමේ දී එම ප්‍රදේශ වල පවතින ස්වභාවික සෞන්දර්යට හානියක් නොවන පරිදි අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරියට හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට උපදෙස් දුන් බවයි.

මෙම සංචාරක ස්ථාන පිළිබඳව දෙස් විදෙස් සංචාරකයන් දැනුවත් කිරීම සඳහා ඉදිරියේ දී රාජ්‍ය හා පුද්ගලික අංශ මෙන්ම තානාපති කාර්යාල ද, සම්බන්ධ කරගනිමින් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව ද ඇමතිවරයා කියයි. සංචාරක අමාත්‍යාංශය සමඟ එක්ව එය ක්‍රියාත්මක කෙරේ.



# "දියත්මා" සංචාරක බෝට්ටු සේවාව

## බත්තරමුල්ල දියත උයනෙන් ඇරඹේ....

(අමිල දර්ශන පේරත්)







දෙස් විදෙස් සංචාරකයන් සඳහා විනෝදාත්මක සේවා සපයනු ලබන නව "දියත්මා" ලේෂර් බෝට්ටු සේවයක් බත්තරමුල්ල. දියවන්නා ඔය කේන්ද්‍ර කරගනිමින් ආරම්භ කරනු ලැබිණි.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් මත ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාව විසින් මෙම විනෝදාත්මක බෝට්ටු සේවාව ආරම්භ කර ඇත.

එහිදී අදහස් දක්වමින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා සඳහන් කළේ කොළඹ නගරයේ හා තදාසන්න ප්‍රදේශවල පිහිටි අභ්‍යන්තර ජල මාර්ගවල මෙවැනි විනෝදාත්මක සේවා සපයනු ලබන බෝට්ටු සේවාවන් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවයි.

රට ආර්ථික අර්බුදයකට මුහුණදී තිබෙන මොහොතක විදේශ සංචිත වැඩිකර ගැනීමටනම් මෙරටට පැමිණෙන සංචාරකයන් රටතුළ වැඩිකාලයක් රැඳී සිටින වැඩ පිළිවෙලක් සැකසිය යුතු බවද අමාත්‍යවරයා පැවසීය. ඒ අනුව සංචාරකයන්ට විනෝදාස්වාදය සැපයීමට මෙවැනි බෝට්ටු සේවා ඉතා වැදගත් බවද හෙතෙම වැඩිදුරටත් කීය.

දිගින් මීටර 13ක් සහ පළලින් මීටර 4ක් වන මෙම බෝට්ටුව දියත්මා යනුවෙන් නම්කර තිබේ. මෙහි 30ට ආසන්න පිරිසකට පහසුකම් සපයා ඇති අතර සාකච්ඡා,සම්මන්ත්‍රණ, සුභද හමු ආදිය පැවැත්වීමට හැකියාව ඇත. සම්පූර්ණයෙන්ම වායු සමීකරණය කර ඇති මෙම බෝට්ටුවේ සේවය ලබාගැනීම වෙනුවෙන් පැයකට අයකෙරෙන මුදල රුපියල් 20,000කි.

මෙම ලේෂර් බෝට්ටු සේවාව ආරම්භ කර පැය කිහිපයක් ඉක්ම යන්නටත් මත්තෙන් 9 දෙනෙකු මෙම බෝට්ටුව වෙන්කරවා ගෙන ඇතැයි ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාව පවසයි. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග, රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු, පාර්ලිමේන්තු මන්ත්‍රී නිමල් බටුර පියානගේ, ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාවේ සභාපති කිරන් බාලසූරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රජීව් සූරියආරච්චි මහත්වරුන් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

(ඡායාරූපය - නුවන් දිශේන්ද්‍ර)

# නාගරික සංවර්ධන අධිකාරිය මෙම වසරේ ආරම්භ කළ ව්‍යාපෘති 215න් ව්‍යාපෘති 175ට ආසන්න ප්‍රමාණයක වැඩ අවසන්...

## ඉතිරි ව්‍යාපෘතිවල වැඩ ලබන වසර තුළ අවසන් කිරීමට විෂයභාර ඇමති ප්‍රසන්නගෙන් නාගරික සංවර්ධන අධිකාරියට උපදෙස්..

(අමිල දර්ශන හේරත්)

මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 10,600ක මුදලක් වෙන්කරමින් මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 215න් ව්‍යාපෘති 175ට ආසන්න ප්‍රමාණයක වැඩ සම්පූර්ණයෙන්ම අවසන් කර ඇති බව නාගරික සංවර්ධන අධිකාරිය පවසයි.

ඒ අනුව තවත් ව්‍යාපෘති 40ක වැඩ අවසන් කිරීමට නියමිතව ඇත. නාගරික සංවර්ධන අධිකාරිය පවසන්නේ මෙම වසරේදී රට මුහුණදුන් අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන් එම ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීම පමා වූ බවයි.

එසේත් ලබන වසරේදී එම ව්‍යාපෘති 40 හි වැඩ අවසන් කිරීමට පියවර ගන්නා ලෙස විෂය භාර අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගෙන් දැනටමත් උපදෙස් ලැබී ඇති බවද නාගරික සංවර්ධන අධිකාරිය සඳහන් කරයි.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන සියක් නගර සංවර්ධන වැඩ සටහන යටතේ මෙරට සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ නාගරික මධ්‍යස්ථාන 117ක් තෝරා ගෙන නගර 116ක ව්‍යාපෘති ආරම්භ කර ඇත. ඉන් නගර 110ක වැඩ මේ වනවිට සම්පූර්ණයෙන්ම අවසන් කර ඇති බවද නාගරික සංවර්ධන අධිකාරිය පවසයි.



" සියක් නගර සංවර්ධන වැඩ සටහන යටතේ නගර 110ක වැඩ සම්පූර්ණයෙන්ම අවසන් "

" ඇවිදින මංතීරු 23ක වැඩ අවසන් "



" සෙත්සිරිපාය තෙවන අදියර ඇතුළු ව්‍යාපෘති 3ක වැඩ අවසන් "

එළෙස වැඩ අවසන් කෙරුණු නගර 110හි පදික වේදිකා, නාගරික විවෘත භූමිවල පිහිටි කාණු පද්ධති, බස් ආවරණ හා සනීපාරක්ෂක පහසුකම් වැනි මූලික මහජන අවශ්‍යතාවයන් සංවර්ධනය කර තිබේ.

පළාත් නගරයේ ව්‍යාපෘති සඳහා මහා භාණ්ඩාගාරය මගින් වෙන්කරන ලද මුදල් භාවිත කරමින් බස් නැවතුම්පළ, මහජන පොළ, පොදු වෙළඳපොළ වැනි ව්‍යාපෘති 44ක් මෙම වසරේදී ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇති අතර ඉන් ව්‍යාපෘති 29ක වැඩ අවසන් කර ඇති බවද නාගරික සංවර්ධන අධිකාරිය පවසයි.

නාගරික ප්‍රදේශයන්හි පහසුකම් සංවර්ධනය කිරීම හා මහජනතාවගේ සෞඛ්‍ය සම්පන්න බව වර්ධනය කිරීමේ අරමුණින් නාගරික සංවර්ධන අධිකාරිය රට පුරා ඇවිදින මංතීරු 25ක ඉදිකිරීම් ආරම්භ කරනු ලැබිණි. මේ වනවිට ඉන් 23ක වැඩ අවසන් කර ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 778ක් වැයවී ඇත.

එමෙන්ම මහා භාණ්ඩාගාරය විසින් රාජ්‍ය ආයතන වෙත ලබාදෙන ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 22ක් ක්‍රියාත්මක කරන ලද අතර ඉන් ව්‍යාපෘති 5ක වැඩ නිමවා ඇතැයිද නාගරික සංවර්ධන අධිකාරිය පවසයි. එමෙන්ම රට මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය හමුවේ ව්‍යාපෘති 13ක වැඩ අඩු ප්‍රගතියක් යටතේ ක්‍රියාත්මක කෙරේ.

බේරේ වැව වටා ඉදිවන ඇවිදින මංතීරුව හා මහජන පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය අත්‍යවශ්‍ය අංග පමණක් නිමකර වැඩ අවසන්කර ඇත.

එමෙන්ම දේශපාලන නායකත්වයේ හා ජනතාවගේ ඉල්ලීම මත රුපියල් මිලියන 2452ක වැය කරමින් ඉදිකිරීම ආරම්භ කළ යාපනය නගර ශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිරි වැඩ



නිමකිරීම සඳහා යාපනය මහනගර සභාව වෙත භාරදීමට නියමිතව ඇත. එහි ඉදිකිරීම් කටයුතු සඳහා රුපියල් මිලියන 1200 ක මුදලක් වැයවී ඇති අතර වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කිරීම සඳහා රුපියල් මිලියන 2620ක මුදලක් අවශ්‍ය ඇතැයි නාගරික සංවර්ධන අධිකාරිය පවසයි.

හෝමාගම තාක්ෂණික නගරය සඳහා ප්‍රවේශය සපයනු ලබන ප්‍රධාන මාර්ගයක සංවර්ධන කටයුතු දැනට ඉඩම් අත්පත් කරගත් ව්‍යාපෘති කොටස අවසන් කර ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 583ක මුදලක් වැයවී ඇත.

ඊට අමතරව නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදලින් රුපියල් මිලියන 8000ක් යොදවා සෙත්සිරිපාය තෙවන අදියර ඇතුළු ව්‍යාපෘති 7ක් ක්‍රියාත්මක අතර ඉන් ව්‍යාපෘති 3ක වැඩ අවසන් කර තිබේ. ඉතිරි ව්‍යාපෘති අඩු ප්‍රගතියක් සහිතව පවත්වාගෙන යාමට යෝජිතව ඇතැයිද නාගරික සංවර්ධන අධිකාරිය සඳහන් කරයි

# ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ සිදුව ඇතැයි කියනු ලබන මූල්‍ය වංචාව සම්බන්ධ ඉදිරි පරීක්ෂණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට....

(නාලක සංජීව දසනායක)

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ සිදුව ඇතැයි කියනු ලබන මූල්‍ය වංචාව සම්බන්ධයෙන් ආයතන මට්ටමින් කරනු ලබන අමතරව එහි පරීක්ෂණ කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බාරදීමට කටයුතු කරමින් සිටින බව නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී ඉංජිනේරු ජේ.ඒ ජානක මහතා පවසයි.

කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ සිදු වුණේයැයි කියන මූල්‍ය වංචාව සම්බන්ධයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මෙතෙක් ගෙන ඇති පියවර පිළිබඳ තමන්ට වහාම වාර්තාවක් ලබා දෙන ලෙස ඇමති ප්‍රසන්න රණතුංග මහතා එම අධිකාරියට පසුගිය (27) දැනුම් දී තිබිණි.

ඊට අදාළ වාර්තාව එදිනම විෂයභාර අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාට ලබාදීමෙන් පසුව ඔහුගේ උපදෙස් පරිදි මෙම තීරණය ගත් බවද නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා පවසයි.

මෙම මූල්‍ය වංචාව පිළිබඳව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය නිසි විමර්ශණයක් සිදුකර නොමැති බවට පසුගියදා මාධ්‍ය ඔස්සේ එල්ලවූ චෝදනාව ප්‍රතික්ෂේප කරන සාමාන්‍යාධිකාරීවරයා මීට අදාළ මුල් පැමිණිල්ල නිර්නාමික දුරකථන ඇමතුමක් ලෙස එවකට දිස්ත්‍රික් කළමණාකාරවරයාට ලැබුණේ මෙම වසරේ මාර්තු මාසයේදී බවත් දිස්ත්‍රික් කළමණාකාරවරයා ඒ පිළිබඳව තමන් දැනුවත් කිරීමෙන් පසුව ප්‍රධාන කාර්යාලය මගින් විමර්ශණ ආරම්භ කළ බවත් සඳහන් කරයි.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රජිව් සූරියආරච්චි මහත්වරු අදාළ තනතුරු සඳහා පත්වීමෙන් පසු මීට අදාළ පරීක්ෂණ කඩිනම් කෙරිණි.

ඒ අනුව අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකළ විමර්ශණයේ අවසන් වාර්තාව පසුගිය නොවැම්බර් මස 17 වැනිදා නිකුත් කර තිබේ.

ආයතනික මට්ටමින් සිදුකළ පරීක්ෂණයෙන් අනාවරණයවී ඇත්තේ මෙම මූල්‍ය වංචාව 2018 වසරේ සිට 2022 වසරේ මුල් කාර්තුව දක්වා සිදු කර ඇති බවයි. එමෙන්ම එම සිද්ධියට අදාළ ලිපි ලේඛණ කොටසක් ගිනි තබා විනාශ කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන්ද පරීක්ෂණ ආරම්භ කර තිබේ.

ඊට සම්බන්ධයැයි මේ වනවිට අනාවරණයවී ඇති ගණකාධිකාරී, ගිණුම් නිලධාරී ඇතුළු නිලධාරීන් 9 දෙනෙකුගේ වැඩ මේවනවිට තහනම් කර ඇති අතර අදාළ වැඩ තහනම සිදුකර ඇත්තේ විමර්ශණවල ප්‍රතිඵලයක් ලෙසය. එමෙන්ම ඔවුන්ට නිවාස අධිකාරියට අදාළ කිසිදු ආයතනයකට ඇතුළු වීමද තහනම් කර ඇත. එමෙන්ම චෝදනාවට ලක්වී ඇති තවත් නිලධාරීන් 4 දෙනෙකු පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදුකෙරෙමින් පවතින බවද සාමාන්‍යාධිකාරීවරයා කියයි.

එමෙන්ම ජාතික නිවාස සංවර්ධන අධිකාරියතුළ ඉදිරියේදී මෙබඳු වංචාවන් සිදුනොවීමට ගතයුතු පියවර සම්බන්ධයෙන් ද ඇමති ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි විශේෂ අවධානය යොමුකර තිබෙන බවද ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී ඉංජිනේරු ජේ.ඒ ජානක මහතා සඳහන් කරයි.

ඒ සඳහා පරිගණක දත්ත ගබඩා කර ගැනීම, මාසිකව ගෙවූ මුදල සම්බන්ධයෙන් දිස්ත්‍රික් කාර්යාලය මගින් එස්.එම්.එස් මගින් ණය හිමියා දැනුවත් කිරීම වැනි මූලික ක්‍රියාමාර්ග දැනට ක්‍රියාත්මක කරනු ලබයි. ඉදිරියේදී මේ සම්බන්ධයෙන් තවත් පියවර කිහිපයක් ගැනීමට අපේක්ෂා කරන බවද සාමාන්‍යාධිකාරීවරයා කියා සිටී.

ජනතා අයිතියට පත් කළ මිනුවන්ගොඩ

# තෙමහල් වෙළඳ සංකීර්ණය හා වනවදුල පරිශ්‍රය



රුපියල් මිලියන 395 ක් වැයකොට ඉදිකළ මිනුවන්ගොඩ නව තෙමහල් වෙළඳ සංකීර්ණය සහ රුපියල් මිලියන 20 ක වියදමින් ඉදිකළ මිනුවන්ගොඩ වනවදුල පරිශ්‍රය විවෘත කිරීම නාගරික සංවර්ධන හා නිවාස ඇමති ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණි.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් මිනුවන්ගොඩ නගර සභාවට අයත් ඉඩමක මිනුවන්ගොඩ නව තෙමහල් වෙළඳ සංකීර්ණය ඉදිකර ඇත.

පළමු මහලේ කඩ කාමර 35 ක්, දෙවන මහලේ කඩ කමර 35 ක් සහ තෙවන මහලේ කඩ කාමර 21 ක් බැගින් සම්පූර්ණ කඩ කාමර 91 කින් මෙය සමන්විත වේ. මෙය වර්ග අඩි 180, 160, 120 වශයෙන් ප්‍රමාණ 3 කින් මෙහි කඩ කාමර ඉදිකර තිබේ.

මෙහි තුන්වෙනි මහලේ නවීන පහසුකම්වලින් සමන්විත ප්‍රේක්ෂාගාරයක් ද ඉදිකර ඇත. එහි විශාලත්වය වර්ග අඩි 2,100 කි. වාහන 40 ක් පමණ නැවැත්වීමට හැකි රථ ගාලකින්ද සමන්විතයි.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් "සියක් නගර" වැඩසටහන යටතේ මිනුවන්ගොඩ වනවදුල පරිශ්‍රය ඉදිකර ඇත. දේශීය නිෂ්පාදන අලෙවි කුටි 12 කින් මෙය සමන්විතයි.

(ඡායාරූප - නලින් හේවාපතිරණ)